# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

සංවර්ධන අධ්‍යයනය - DVST – E3025

මානව සම්පත් සංවර්ධනය සහ සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන
ප්‍රශ්න <u>පහකට (05)</u>පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි　　　　　　　　කාලය : පැය 03 යි

---

### <u>1 කොටස : මානව සම්පත් සංවර්ධනය</u>

01. 'මානව සම්පත් සංවර්ධන සංකල්පය' පැහැදිලි කර දියුණු වෙමින් පවත්නා රටවල සංවර්ධනයට ඉන් ලද හැකි ප්‍රයෝජ්‍යතාව පහදන්න.

02. සංවර්ධනය වෙමින් පවත්නා රටවල මානව සම්පත් හි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ලක්ෂණ නිදසුන් ඇසුරින් ගෙනහැර දක්වන්න.

03. මානව ප්‍රාග්ධනය (Human capital) ඒකරාශී කිරීමේ දී ආහාර අවශ්‍යතා සහ පෝෂණය සපුරාලීම තුලින් ඉටුකෙරෙන භූමිකාව විමර්ශණය කරන්න.

04. 'සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ' (Millennium Development goals) තුලින් කෙතෙක් දුරට දිළිඳු ප්‍රජාවගේ අපේක්ෂාවන් කෙරෙහි අවධානය යොමුකර තිබේදැයි විග්‍රහ කරන්න.

### <u>11 කොටස : සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි</u>

05. 'පර්යේෂණ' යනු කුමක්දැයි පහදා, සංවර්ධන අධ්‍යයනවලදී එහි ඇති ව්‍යවහාරික වැදගත්කම පැහැදිලි කරන්න.

06. පර්යේෂණ ගැටලුවක් හඳුනාගෙන එය විග්‍රහකරන ආකාරය උචිත නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

07. 'ප්‍රාථමික දත්ත' සහ 'ද්විතියික දත්ත' පැහැදිලි කොට, ව්‍යවහාරික පර්යේෂණ වලදී ප්‍රාථමික දත්තවල ප්‍රයෝජන අගයන්න.

08. උචිත නිදසුන් උපයෝගීකරගෙන මතු සඳහන් ඒවායින් <u>දෙකකට (02)</u> කෙටි සටහන් ලියන්න.

    i. සසම්භාවී අංක වගු (Random table)
    ii. පොකුරු නියැදීම (Cluster sampling)
    iii. පහසු නියැදීම (Convenience sampling)
    iv. ස්තෘත සසම්භාවී නියැදීම (Stratified random sampling)